මගේ අංකය - ඩී16/ස්ථාන මාරු/2024
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2024.08. 21

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

**2024 වර්ෂ අවසාන ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම.**

2024 වර්ෂ අවසාන ස්ථාන මාරුවීම් සඳහා I පෙළ ජේලර්/I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරු වලට පහළ සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ගේ අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

02. මෙයට යා කොට ඇති ස්ථාන මාරු අයදුම්පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත් උපයෝගී කරගෙන නිලධාරීන්ගේ/නිලධාරිනියන්ගේ ස්ථානමාරු අයදුම්පත්‍ර 2024.08.31 දිනට ප්‍රථම ලබා ගෙන එම අයදුම්පත්‍ර මෙයට අමුණා ඇති ලේඛනයට අනුව සකස් කරගත් ආකෘති පත්‍රයේ ලේඛනගත කර, එම ලේඛන සහ ස්ථාන මාරු අයදුම්පත්‍ර 2024.09.10 දිනට ප්‍රථම මා වෙත එවිය යුතුය. මෙම ආකෘතිය සකස් කළ යුත්තේ A3 ප්‍රමාණයේ කඩදාසිවල වන අතර, 05,06 ඡේදයේ සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර, ඒ අනුව කටයුතු කළයුතු බව දන්වමි. (අයදුම්පත් ලේඛනයේ අනුපිළිවෙලට අයදුම්පත් අමුණා එවිය යුතු අතර, අයදුම්පත්‍රයේ ඉහළ දකුණු කෙලවර නිලධාරියාට අයදුම්පත් ලේඛනයේ හිමි අනු අංකය සටහන් කළ යුතුය.)

03. සියළුම ස්ථාන මාරු අයදුම්පත්‍ර වල අඩංගු තොරතුරු පිළිබඳ ඔබ සෑහීමකට පත්විය යුතු අතර, නිලධාරියාගේ ස්ථිර පදිංචිය හා ස්ථාන මාරු අයදුම්පත්‍රයේ 08 කොටසින් විමසා ඇති නිලධාරියෙකු සිය සේවා කාලය තුල සේවය කර ඇති ආයතනය පිළිබඳ විස්තර අනිවාර්යයෙන් සටහන් කළ යුතුය. එසේ අදාළ තොරතුරු ඇතුළත් නොකර ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ ස්ථානමාරු සම්බන්ධයෙන්, ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි කටයුතු කරනු ලැබේ. ඔබේ නිර්දේශය පැහැදිලිව අයදුම්පත්‍රයේ හා ආකෘති පත්‍රයේ කෙටියෙන් සඳහන් කළ යුතුය.

04. අයදුම්පත්‍ර ලේඛනය පරීක්ෂා කිරීම ජේලර් නිලධාරියෙකු විසින් සිදු කළ යුතුය.

05. ඔබ ආයතනයේ නිලධාරීන්ගේ ස්ථානමාරු අයදුම්පත්‍ර මූලස්ථානයට එවීමේදී පහත පරිදි ක්‍රියා කළ යුතුය.

I. එක් එක් ශ්‍රේණි හා තනතුරු අනුව වෙන වෙනම ආකෘති පත්‍ර භාවිත කළ යුතුය.

II. ආයතනයේ වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ විස්තර පළමුවත් ඊට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ විස්තර ඊළඟටත් සේවා කාලය අඩුවන අයුරින් ලේඛනයේ ඇතුළත් කළ යුතුය.

III. විනය හේතූන් මත ස්ථාන මාරු කිරීමට ඔබ විසින් නිර්දේශ කරන නිලධාරීන් සම්බන්ධයෙන් විස්තර එවීමට වෙනම ආකෘති පත්‍ර භාවිත කළ යුතුය.

IV. අයදුම්පත්‍ර ලේඛන ගත කිරීමේදී ආදර්ශ ආකෘතිය අනුව නියමිත තීරුවේ නියමිත විස්තර හැකි තරම් කෙටියෙන් පැහැදිලි අකුරින් සඳහන් කළ යුතුය.ලේඛනගත කිරීමේදී (ආකෘති පත්‍රයේ එක් පැත්තක අයදුම්කරුවන් අට දෙනෙකුගේ විස්තර දැක්වීමට සීමා විය යුතුය) කොළයේ දෙපිටම භාවිත කළ යුතුය.

Scanned with CamScanner

ස්ථාන මාරු කිරීමේ සුදුසුකම්

I. පූර්ව වර්ෂයන්හි වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු සිදු කර ඇති එහෙත් මෙතෙක් එම නියෝග ක්‍රියාත්මක නොවී, අත්හිටුවා/ප්‍රමාද කොට ඇති සියළුම නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග මෙමඟින් අවලංගු කරන අතර, නිලධාරියා/නිලධාරිනිය 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු කර ඇතත්, අදාල ආයතනයන් වෙත මුදවා හැර නොමැති නම් ඒ පිළිබඳ තොරතුරු අධිකාරි නිර්දේශය මත සටහන් කරන්න. ස්ථාන මාරු ඉල්ලුම් කිරීමටවසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ඕනෑම නිලධාරියෙකුට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර, 2024.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සියළුම නිලධාරීන් අනිවාර්යයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. විනය හේතූන් මත නිර්දේශ කරන්නේ නම් මෙම කාල සීමාව නොසැලකිය යුතුය. (බන්ධනාගාර සිර මැදිරි ද ඇතුළුව)

වෙනත්

I. අඛණ්ඩව කොළඹ බන්ධනාගාර පරිශ්‍රය තුළ වසර 10 කට වඩා වැඩි කාලයක් (වැලිකඩ, කො.රි.බ, නව මැගසින්, ප.වි.පු.ම, මූලස්ථානය) සේවය කළ නිලධාරීන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, තම අයදුම්පත්‍රයේ ස්ථාන මාරු වී යාමට කැමති ආයතනයන් සඳහන් කිරීමේදී සලකා බැලීම සඳහා එම පරිශ්‍රයට පරිබාහිර ආයතනයන් අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.

II. සිර මැදිරියක සේවයේ යෙදී සිටින නිලධාරියෙකු /නිලධාරිනියක නැවත සිර මැදිරියකට ස්ථාන මාරු කිරීමට සලකා බලනු නොලැබේ.

III. ස්ථාන මාරුවීම් දීමේදී එකම ආයතනයක එකම පවුලේ අය සේවයේ යෙදී සිටී නම් ඒ සඳහා ඉඩ ලබා දෙනු නොලැබේ.

IV. අයදුම්කරුවන්ගේ කැමැත්ත පරිදි ස්ථාන මාරු වී යාමට කැමති ස්ථාන 02 ක් ඉදිරිපත් කළ හැක. ඔවුන් සිය කැමැත්ත පරිදි තම ගම් ප්‍රදේශවල හෝ ඊට ආසන්නව පිහිටි බන්ධනාගාරයකට හෝ ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති අයදුම්කරුවන් සඳහා ඒ ඒ ආයතනවල ඒ ඒ ශ්‍රේණිවල පවතින පුරප්පාඩු සැලකිල්ලට ගෙන සහනදායී පරිදි කටයුතු කරනු ලැබේ.

V. ස්ථාන මාරු වීම් සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කරන නිලධාරීන් තම ස්ථානයේ වසර 03 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සපුරා ඇත්නම් පමණක් ස්ථාන මාරු ගමන් වියදම් ලැබීමට හිමිකම් ලැබේ.

VI. දැනට කාර්යාල සේවයේ යෙදී සිටින නිලධාරීන්/නිලධාරිනියන් ආයතනයේ නියමිත සේවා කාලයක් සේවය කිරීමෙන් පසු ස්ථාන මාරු කිරීමට හැකි වන පරිදි ඔවුන් වෙනුවට වෙනත් නිලධාරීන් පුහුණු කළ යුතුය. (ස්ථාන මාරු කළ පසු ගැටළුවක් ඇති නොවන පරිදි) කිසිම නිලධාරියෙකු අත්‍යාවශ්‍ය සේ සලකා ඔහු ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් ඉල්ලීම් අධිකාරීන් විසින් නොකළ යුතුය.

VII. නිල නිවාසයන්හි අවුරුදු 05 කට අධික කාලයක් පදිංචිව සිටින නිලධාරීන්ට එම නිවාස වලින් ඉවත්වන ලෙසද නියෝග කළ යුතු අතර, එම නියෝගය නොපිළිපදින අය ස්ථාන මාරු කිරීම සඳහා සේවා ස්ථාන අධිකාරී විසින් එම නිලධාරියා සඳහා ස්ථාන මාරු අයදුම්පතක් පිළියෙල කළ යුතුය.

VIII. ආයතනයේ හෝ සිර මැදිරියක නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇතත්, ස්ථානමාරු ඉල්ලීම නොකරන නිලධාරීන් සඳහා සේවා ස්ථාන අධිකාරී විසින් අනිවාර්යයෙන්ම අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුය. එසේ ස්ථානමාරු අයදුම්පත්‍ර සේවා ස්ථාන අධිකාරීවරයා විසින්ද ඉදිරිපත් කිරීම පැහැරහැරියහොත්, ස්ථානමාරු මණ්ඩලයේ පූර්ණ අභිමතය පරිදි එම නිලධාරීන් ස්ථානමාරු

Scanned with CamScanner

කරන අතර, ඔවුන් එම ස්ථානමාරු මණ්ඩලයේ තීරණ හා එකඟ විය යුතුය. වසර 05 ක් ඉක්මවා සිටින නිලධාරීන්ගේ විස්තර එවා නොමැති බව පසුව අනාවරණය වුවහොත් ඒ පිළිබඳව අධිකාරීවරයා මෙන්ම විෂයභාර නිලධාරීන්වද විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

IX. විනය හේතූන් මත නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට නිර්දේශ කිරීමට ප්‍රථම එම නිලධාරියාට රාජකාරි දුර්වලතාවයන් මඟහරවා ගැනීමටත් සේවයේ ප්‍රගතියක් ඇති කර ගන්නා ලෙසටත් මුලින් ලිඛිතව අවවාද කර තිබිය යුතුය.

X. දැනටමත් ඔබ ආයතනයට නිලධාරියා ස්ථාන මාරු කර එවා ඇත්තේ විනය හේතූන් මත නම් එම විස්තර සඳහන් කළ යුතුය.

XI. කිසියම් හේතුවක් මත ස්ථාන මාරු කර වසර 02 කාලයක් නොමැති නිලධාරීන්ට ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමට හිමිකම් නොමැති බව ද දන්වමි.

06.අයදුම්පත්‍ර සහ අදාළ ලේඛන මා වෙත එවීමේදී ආයතනයේ අදාළ එක් එක් තනතුරේ අනුමත නිලධාරීන් සංඛ්‍යාව, දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව හා දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව දැක්වෙන වෙනම සටහන් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය.

<u>කාල සටහන</u>

- 2024.08.31 දිනට පෙර සේවා ස්ථාන අධිකාරීවරුන් අයදුම්පත්‍ර භාර ගැනීම.
- 2024.09.10 දිනට හෝ ඊට පෙර අයදුම්පත්‍ර ලේඛන මූලස්ථානයට එවීම.
- 2024.10.25 මාරුවීම් තීරණ අදාළ නිලධාරීන්ට දැනුම් දීම.
- 2024.11.10 අභියාචනා අයදුම්පත්‍ර ලේඛන මූලස්ථානයට එවීම.
- 2024.12.01 අභියාචනා තීරණ දැනුම් දීම.
- 2025.01.01 ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම.

07. ඉහත සඳහන් කරුණු කෙරෙහි සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර අධිකාරීවරුන්ගේ අවධානය යොමු විය යුතු අතර, නියමිත කාල සීමාව අවසානයේ අදාළ කාර්යය නිම කිරීම සඳහා පුද්ගලිකව අදාළ නිලධාරීන් ක්‍රියාකල යුතු බවද මෙයින් දන්වමි.

08.වාර්ෂික ස්ථානමාරු නියෝගයක් කිසිදු කරුණක් මත වෙනස් නොකරන බවත්, එහි අවසාන තීරණය වාර්ෂික ස්ථානමාරු අභියාචනා කමිටුව පමණක් සතු බවත් දන්වමි.

එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධ... කොමසාරිස් ජනරාල්
... ...ගාර මූලස්ථානය
... කොළඹ 09.

Scanned with CamScanner

(16)

| | |
|---|---|
| තනතුර | |
| ලිපිගොනු අංකය | |
| ස්ත්‍රී/පුරුෂ | |

## වර්ෂ අවසාන ස්ථාන මාරු අයදුම්පත්‍රය - 2024

01. නම :-
02. තනතුර :-
03. 2024.12.31 දිනට වයස :-
04. I. ස්ථිර පදිංචි ලිපිනය :- II. දැනට පදිංචි ලිපිනය :-

05. දැනට සේවය කරන ස්ථානය හා එහි සේවා කාලය :-
06. දෙපාර්තමේන්තුවේ මුළු සේවා කාලය :-
07. 2024.12.31 දින දක්වා පදිංචි ගම් ප්‍රදේශයේ සේවය කර ඇති කාල සීමාව :-
08. මුල් පත්වීමේ සිට සේවය කර ඇති ස්ථාන හා කාල සීමාවන් සමඟ ස්ථාන මාරුවීමට හේතු (දෛනික සේවා කාලයන් සමඟ)

| ආයතනය | සේවා කාලය (.....................සිට................දක්වා) | ස්ථාන මාරුවීමට හේතු |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. ස්ථිර පදිංචි ප්‍රදේශයට සමීප සේවා ස්ථානය :-
10. ස්ථාන මාරු වීමට කැමති ස්ථාන :-

    1.

    2.

    3.

11. ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට හේතු :-

    I. ආයතනයේ සේවා කාලය සම්පූර්ණ වීම ☐

    II. හේතුන් ☐

12. ඉහත 11 සඳහා පිළිතුරු ආයතනයේ සේවා කාලය සම්පූර්ණවීම නම් ඔබ තවදුරටත් දැනට සේවය කරන ආයතනයේම සේවය කිරීමට කැමතිද/අකමැතිද?

Scanned with CamScanner

13. I. ඔබ නිල නිවාස ඉල්ලුම් කිරීමට අදහස් කරන්නේද?

II. නැතහොත් ස්ථාන මාරු ඉල්ලා සිටින ස්ථානයේ පදිංචියට නිවසක් තිබේද?

14. විවාහක/අවිවාහක බව හා විවාහක නම් දරුවන් ගණන :-

15. බිරිඳ රැකියාවක යෙදී සිටී නම් ඇගේ සේවා ස්ථානය :-

16. දැනට සිටින ස්ථානයට ස්ථාන මාරුවීමට හේතු :-

17. තම පවුලේ අයෙකු බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටීද, එසේ නම් ඔහුගේ/ඇයගේ සේවා ස්ථානය :-

18. තනතුර :- ඥාති සම්බන්ධය :-

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය :- ..............................................

අයදුම්කරුගේ අත්සන

<u>අධිකාරී නිර්දේශය</u>

අයදුම්පත් කැඳවීමේ දිනයට ආසන්න මාස 06 ක කාලය තුල නිලධාරියා සේවයට පැමිණීමේ ප්‍රතිශතය (100%) නිවැරදිව දක්වන්න.

යථෝක්ත නිලධාරියා/නිලධාරිනිය විසින් ඉහතින් දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහු මෙම ආයතනයට ස්ථානමාරු කර ඇත්තේ විනය හේතූන් මත/විනය හේතූන් මත නොවන බවත්, ඔහු/ඇය වර්ෂ අවසාන ස්ථාන මාරු ඉල්ලීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති/නැති බවත් දන්වමි.

ස්ථාන මාරු අයදුම්පත නිර්දේශ කරමි.

..........................................................................................................................................

..........................................................................................................................................

.............................හේතූන් මත නිර්දේශ නොකරමි.

දිනය :- ..................................

බන්ධනාගාර අධිකාරී

<u>සැ.යු</u>

01. නිලධාරියා /නිලධාරිනිය විනය හේතූන් මත ඔබ ආයතනයට මාරු කර ඇත්නම් ඒ සම්බන්ධව විස්තර සහිතව වාර්තා කළ යුතුය.

02. නිලධාරියා/නිලධාරිනිය 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු කර ඇතත්, අදාල ආයතනය වෙත මුදවා හැර නොමැති නම් ඒ පිළිබඳ තොරතුරු අධිකාරී නිර්දේශය යටතේ සඳහන් කරන්න.

03. විනය හේතූන් මත ස්ථාන මාරු කිරීමට නිර්දේශ කරන්නේ නම් එම විස්තර වෙනම දැක්විය යුතුය.

Scanned with CamScanner CamScanner

....................................... බන්ධනාගාරය/සිර මැදිරිය

| තනතුර | අනුමත නිලධාරී සංඛ්‍යාව | 2024.08.31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරී සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

Scanned with CamScanner

2024 වර්ෂ අවසාන ස්ථාන මාරු

..............................බන්ධනාගාරය/සිර මැදිරිය..............................තනතුරේ ස්ථාන මාරු

සකස් කළේ :-.............................................                    .............................................

නම                    අත්සන

පරීක්ෂා කළේ :-.............................................                    .............................................

නම                    අත්සන

| අනු අංකය | නම හා 2024.12.31 දිනට වයස | වර්තමාන සේවා ස්ථානය, සේවා කාලය සහ පැමිණි දිනය | දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සේවා කාලය හා එකී සේවා කාලය තුළ සේවය කළ ආයතන හා සේවා කාලය වෙන වෙනම | ගම් ප්‍රදේශයේ සේවා කාලය | ගම් ප්‍රදේශයට සමීප සේවා ස්ථානය | ස්ථාන මාරුවීයාමට කැමති ස්ථානය | ස්ථාන මාරු ඉල්ලීමට හේතු (කෙටියෙන්) | විවාහක/අවිවාහක සහ දරුවන් ගණන | දැනට සිටින ස්ථානයට මාරු වීමට හේතු | අධිකාරී නිර්දේශය | ස්ථාන මාරු නියෝගය | අභියාචනා මණ්ඩල තීරණ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |